# ශ්‍රී ලංකාවේ සම්ප්‍රදයික

# ගොවිපල තාක්ෂණය

පර්යේෂණ හා පුහුණුකිරීමේ
නිලධාරි

## ඩී. තෙන්නකෝන්

සම්ප්‍රදයික ගොවි උපකරණ සමහරක්:




1 වල්කැත්ත 2. පොරව 3. වක් උදල්ල

**ස**ම්ප්‍රදයික තාක්ෂණය යනු වෙන් පෞරාණික තාක්ෂණයෙන් පරම්පරාවෙන් පරම්පරාවට (ඉතා සුළු වෙනස්වීම් සහිතව) නොනැසී පැවැත අදද විද්‍යමාන වන ක්‍රම ශිල්ප හඳුන්වනු ලබයි. මිනිසා තමාගේ අභිප්‍රායන් (අවශ්‍යතාව යන්) මුදුන් පමුණුවා ගනු වස්, පරිසරයට සහ සමාජචාරිත්‍ර ධර්ම වලට ගැලපෙන තමාට පහසුවෙන් හසුරුවා ගත හැකි ආකාරයේ ක්‍රම ශිල්ප නිර්මාණය කර ගනියි. මේ හේතුවෙන් එම ක්‍රම ශිල්ප විසින් සමාජ අර්ථ ක්ෂේත්‍රයන්හි ගැටලු නිර්මාණය නොකරන ලද අතර එකී ශිල්පඥනයන්ගේ ප්‍රතිලාභ මුළු සමාජයටම පොදුවේ බෙදී යන ලදී. අද මහා පරිමාණ නූතන තාක්ෂණය විසින් දිනෙන් දින සමාජ ආර්ථික ප්‍රශ්න ඇති කරනු ලබන අතර එම තාක්ෂණයන් කොතෙක් කලකට මිනිසාගේ පාලනය යටතේ පවත්වා ගත හැකි දැයි යන්නත් සැකයක් වී තිබේ. එසේ නූතන තාක්ෂණයන්ගේ ප්‍රතිලාභ මුළු මහත් ජනතාව අතරේ සමසේ බෙදී නොයාම නිසා දියුණු සහ නොදියුණු යන (මිනිසා විසින්ම නිර්මානය කරනු ලබන පරිදි) මිනිස් සමාජ දෙක තුළ පරතරය එන්ට එන්ටම වැඩි වෙමින් පවතී.

ගොවිපල අංශයෙන් පමණක් නොව වෛද්‍ය ශාස්ත්‍රය, කර්මාන්ත, සූප ශාස්ත්‍ර, ම නෝ විද්‍යා යනාදී අංශයන්ගෙන් විවිධ වූ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදයික විද්‍යාඥානය සුළු කොට සහ නොදියුණු කොට තකනු ලැබූ උගත් ලාංකිකයෝ 18 වන, 19 වන සහ 20 වන සියවස්වල බහුලව සිටි බව නොරහසකි. විදේශීය භාෂාවක් කතාකිරීමෙන්, විදේශීය ගති පැවතුම් පිළිපැදීමෙන් තමන් සම්ප්‍රදයික ලාංකික ජීවිතයෙන් වෙන්ව දියුණු ලෝකයකට පිවිසියේ යයි මානසික සුවයකට එලඹී එම පිරිස් ස්වකීය සංස්කෘතික සම්ප්‍රඥනයෙන් සහ මිශ්‍රණයෙන් ලබා ගත යුතු දියුණුව සහ යහපත වරදවා පරිශීලනය කරන්නට වූහ. මහ ගත්කරු මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ "සිංහල භාෂාව හා ශිෂ්ඨාචාරය" නමැති ග්‍රන්ථයේ පරිච්ඡේද කිහිපය කදීම මෙම සස්ංකෘතික විනාශයේ පල විපාකපෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාවේ සම්ප්‍රදයික ගොවිපල තාක්ෂණය (ක්‍රම ශිල්ප) මුළු මහත් ගොවි ජනතාවට පොදු විය. හැම ගොවියෙක්ම පාහේ මෙම ක්‍රම ශිල්පය (ගොවි උපකරණ නිෂ්පාදනය පිළිබඳව) සම්පූර්ණයෙන් හෝ මද වශයෙන් දැන සිටියහ. උදහරණයක් වශයෙන් සී සෑමට ගන්නා ලීයෙන් සාදන ලද නඟුල ගෙන බලමු. ඉංග්‍රීසි එල් අකුරේ හැඩයට වැවී ගිය ගසක අත්තක් කපා (වට ප්‍රමාණය මීටර් 1කට වැඩි) වැයක සහ නියනක ආධාරයෙන් නඟුලක් සාද ගැනීමට හැම ගොවියෙක්ම දැන සිටියහ. මෙය ගොවි

යාට පාලනය කරගත හැකි සුළු තාක්ෂණික විදියකි. කම්මලෙන් සාදගන්නා හීවැලක් සවිකිරීමෙන් නගුලේ ශක්තිය වැඩිවේ. මෙම ක්‍රමයට අවුරුදු 3000 ක් පමණ දීර්ඝ ඉතිහාසයක් තිබේ. සිදුහත් කුමරුගේ පියාණන්වන සුද්දෝධන රජුන් විසින් පවත්වන ලද වප් මඟුල් උත්සවයට ගවයන් විසින් අදිනු ලබන නගුල භාවිතා කළ බව බෞද්ධ සාහිත්‍යය කියයි. ශ්‍රී ලංකාවේ දේවානම් පියතිස්ස (ක්‍රි. පූ. 300 පමණ) මහ රජුගේ කාල යේදී පවා වප්මඟුල් උත්සව පැවැත්වූ බව වංශ කතා වලින් හෙලිවේ. වර්තමානයේ ශ්‍රී ලංකාවේ රාජ්‍යනායකයා විසින් වර්ෂයක් පාසා වප් මඟුල් උත්සවයක් පැවැත්වීමෙන් සම්ප්‍රදායික කෘෂිකාර්මික කටයුතු ආරම්භ කරනු ලබන අතර ඒ සඳහා මී ගවයන් බඳින ලද නගුල භාවිතා කිරීමෙන් සම්ප්‍රදායික තාක්ෂණයේ වැදගත්කම පොදු මහජනතාවට අවබෝධ කර දීමක් සේ සැලකීමට පුළුවන.

ආර්‍යයන් විසින් ශ්‍රී ලංකාවේ වී ගොවිතැන පදනම් කර ගත් නව ජනාවාස පිහිටුවීම පිළිබඳව වංශ කතා සහ ශිලා ලේඛන වලින් සාක්ෂි ලැබේ. මෙම ජනාවාස විශාල ජලාශ සහ වාරිමාර්ග පද්ධති ආශ්‍රය කරගත් අතර එම වාරිමාර්ග යටතේ විශාල කුඹුරු යාය වලින් සමන්විතවූ බව කියැවේ. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ අහලේ සිතියම් හෝ ගුවන් ඡායාරූප පරීක්ෂා කර බලන්නෙකුට පෙළින් පෙළට ඉදිවූ කුඩා ප්‍රමාණයේ වැව් කොපමණ ඇත්දැයි බලා ගත හැකිය. හෙළ ගොවියා විසින් පළමුව පරිසරය පරීක්ෂා කර බලා තම අත්දැකීම් වලට අනුව එම පරිසරය තමාගේ ප්‍රයෝජනයට ගත හැකි ආකාරය කල්පනා කර බලයි. ගංගා ඔයවල් හෝ ආරවල් ආශ්‍රිත නිම්න පටුවන තැන් වලදී ගල් සහ පස් භාවිතා කර විශාල බැම්මක් ඉදිකිරීමෙන් ජලාශයක් ඉදි කරයි. මෙම ජලාශයේ සිට ජලය ගෙන යාම සඳහා යොදගන්නේ ගුරුත්වාකර්ෂණ බලයයි. ගුරුත්වාකර්ෂණ බලයෙන් ජලය ගෙන ගොස් වගා කළ හැකි පහත් බිම් කුඹුරු ඉඩම් බවට පත් කරයි. ජලාශයේ සිට ගුරුත්වාකර්ෂණ බලයෙන් ජලය ගෙන ගොස් අස්වැද්දිය හැකි ඉඩම් තිබුනද ජලාශය සහ එම ඉඩම අතර භූමියේ පිහිටීම (පහත්) අයහපත් නම් අවශ්‍යස්ථානයේ අමුණක් ඉදිකිරීමෙන් ජල මට්ටම සමාන කර එම අමුණේ සිට ජලය ලබාගත හැකි පරිදි යෝග්‍ය කුඹුරු යාය අස්වද්දනු ලැබේ. ජලාශයේ තෙරපුම කෙලින්ම වැව්කන්දට [බන්ඩ්] නොවැටී, වාන දෙසට විහිදී යැමට හැකිවනු පිණිසත්, හදිසි ජලගැල්මකදී කුඹුරු යාය සහ ගංගොඩ බේරා ගැනීමට හැකිවනු පිණිසත් වැව් බැම්ම [වැව් කන්ද] මඩවාන දෙසට මඳක් ඇල කරනු ලබයි. මෙම කාර්යයන් සඳහා යොද ගනු ලැබුවේ වැඩි වශයෙන්ම මිනිස් ශ්‍රමයයි. කලුගල් ප්‍රවාහණය සඳහා ඇතුන් සහ ගවයන් බැඳි [මී ගවයන් සහ ගොනුන්] කරත්ත භාවිතා කළ බවට ඉහි ජන ප්‍රවාද වලින් ලැබේ. සංවිධානාත්මක වූ සහ මනාව හසුරුවනු ලබන මිනිස් ශ්‍රමය මහා පරිමාණ යන්ත්‍ර සූත්‍ර වලට වඩා එලදයී බව මෙයින් මොනවට පැහැදිලිය. ශ්‍රී ලංකාවේ පෞරාණික ශිල්පඥනයන් භූගෝල විද්‍යාත්මක ඥනයට ගැලපෙන පරිදි යොද ගත් බව මෙහිදී තරයේ මතක තබා ගත යුතු කරුණකි. පැරණි ගොවියා තෙත් කලාපයේ වැව් කර්මාන්තය දියුණු නොකිරීමෙන් මේ බව පැහැදිලි වේ. වැව් කර්මාන්තය මූලික අවශ්‍යතාවයන් දෙකක් සපුරා ගැනීමට (පරිසරයට යෝග්‍ය පරිදි) අරමුණු වූවකි.

එනම්

1. ජලය හිග කාලයට ගොවිතැනට අවශ්‍ය ජලය සැපයීම හා

2. භූගත ජල මට්ටම සමව පවත්වා ගැනීම

මෙහි පළමු කරුණ පැහැදිලිය. දෙවන කරුණ ඉතාම වැදගත්ය. වියළි කලාපයට අධික වර්ෂාවක් ලැබෙන්නේ ඔක්තෝබර්, නොවැම්බර්, දෙසැම්බර්, යන මාස වලය. පසේ විවරගතිය මද නිසා පොළොව බී ගන්නා ජල ප්‍රමාණයට වඩා බැස යන ජල ප්‍රමාණය අධිකය. කුඩා ප්‍රමාණයේ වැව් පෙළින් පෙළ රාශි වශයෙන්




4. නගුල සහ පතකඩය 5. වියගහ 6. කෙවිට

ඉදිකිරීමෙන් පැහැදිලි වනුයේ එම කාර්යයේ වැදගත් අංශයක් වශයෙන් පරිසරය ආරක්ෂාකර ගැනීමේ අවශ්‍යතාවය සලකනු ලැබූ බවය. මෙම වැව් පහළ ගම්මාන වල ගෙවතු නියංකාලයට ආරක්ෂා කර ගැනීමටත්, ළිංවල ජල මට්ටම ආරක්ෂා කර ගැනීමටත්, වැව ඉස්මත්තේ කැලය සහ තණ පිට්ටනි නියඟයෙන් ආරක්ෂාකර ගැනීමටත් මෙනයින් හැකි විය.

ජනප්‍රවාද අනුවත්, දැනට පුරාණ ගම්වල දක්නට ඇති පරිදිත් ගම්වාසීන්ගේ සාම්ප්‍රදායික නීතියට අනුව තමන් විසින් හානි නොකළ යුතු ආරක්ෂක වන පටියක් [මූකලාන) වැව් ඉස්මත්තේ සහ හේන් වලට පහලින් විය. වැව් ඉස්මත්තේ හේන් වගා නොකළ යුතු විය. ජලාශයේ ප්‍රමාණයට වඩා [වර්ෂාවෙන්] ජලය ලැබෙන්නේ නම් එම වැඩි ජලය වෙනත් ජලය අඩු ජලාශයකට ගලායන පරිදි ජල බෙක්මක් (කෘත්‍රිමව ඉදිකරන ලද උස් වැටිය මගින්) වැව් ඉහලින් ඇති කරනු ලබයි. මේ ආකාරයේ ශිල්ප ක්‍රමවල නටබුන් වියළි කලාපයේ දැනට අත්හැර දමා ඇති පැරණි වැව් ආශ්‍රයෙන් බලා ගත හැකිය. මෙම ජල බැස්මේ මායිමට අයත් වන (මූකලාන) කැලය ආරක්ෂිත කැලයක් වශයෙන් පැරණියන් විසින් සලකනු ලැබූ බව ප්‍රකටය. මෙය පාංශුබාදන මගින් ජලාශය ගොඩවී යෑම වලක්වා ලීමට යොදන ලද ක්‍රමෝපායක් වශයෙන් සැලකිය හැකිය. සම්ප්‍රදායික නීතියට අනුව ගම දෙපස කැලය ගැමියාගේ පොදු වස්තුවක් විය. ඔවුන්ගේ එදිනෙද අවශ්‍යතාවයන් සඳහා සියලුම දෙනාම එකසේ එම වන සම්පත ප්‍රයෝජනයට ගත්හ. එහෙත් එහා මහ කැලය තුළ (මූකලාන) හේන් ගොවිතැන් නොකළ බව තොර




7. පෝරව. 8. අත් පෝරුව.

හසකි. කුඹුරු යාය දෙපස කැලය හේන් ගොවිතැන සඳහා යොදගන්නා ලදී. කුඹුර සහ හේන යාව පිහිටීම නිසා තම ගොවිපල පාලනය කර ගැනීම ගොවියාට වඩා පහසු විය.

ගොවිපල තාක්ෂණයෙහි අනෙක් වැදගත් අංශය වන, ගොවිපල බලය යොදගැනීම උපකරණ නිර්මාණය සහ පාවිච්චිය සහ අනෙකුත් වගා ක්‍රම දෙස බලමු. මධ්‍යතන යුගයේ ශ්‍රී ලංකාවේ ගොවියන්ගේ තාක්ෂණික ඥානය පිළිබඳ බටහිර වියතුන්ගේ ලියවිලි සහ අද ඇත පිටිසර ගොවියාගේ කටයුතු විමර්ෂණය කර බැලීමෙන් මේ පිළිබඳව සත්‍ය චිත්‍රයක් සකස් කර ගත හැකිය. රොබට් නොක්ස්විසින් 17 වන ශත වර්ෂයේ මැද භාගයේ ලියන ලද **ලංකාවේ ඓතිහාසික සබඳතා** නම් ග්‍රන්ථයෙන් සහ ජෝන් ඩේවි විසින් 1821 ලියන ලද **"ලංකාවේ අභ්‍යන්තරය, ජනජීවිතය හා සංචාරක කරුණු එකතුවක්"** නම් ග්‍රන්ථයෙන් මෙහිදී වැදගත් තොරතුරු සපයයි. (මෙම ග්‍රන්ථයන්හි ඉංග්‍රීසි පිටපත් භාවිතා කරන ලදී.)

රොබට් නොක්ස්ගේ ග්‍රන්ථයේ iii වැනි පරිච්ඡේදයෙහි සම්ප්‍රදායික වී ගොවිතැන් ක්‍රමය පිළිබඳ විස්තර වෙයි. අදද භාවිතා කෙරෙන පරිදි තෙත් කලාපිය ප්‍රදේශවල කෙරෙන, ගුරුත්වා වාරිමාර්ග ක්‍රමය, කඳු බෑවුම් වල මලු ආකාර ලියදි ලි නඟුලෙන් ගවයන් බැඳ සීසෑම ලීයෙන් සාදන ලද පෝරුවෙන් මට්ටම් කිරීම අත් පෝරු භාවිතය උදලු භාවිතය දැකැත්තෙන් ගොයම් කැපීම, ගවයන්ගෙන් ගොයම් මැඩවීම ආදී පොදු වගා ක්‍රම පිළිබඳ විස්තරයක් මෙම ග්‍රන්ථයේ වෙයි. මෙම පෞරාණික ක්‍රම සම්පූර්ණයෙන්ම අද භාවිතා කරන ක්‍රම හා සමානය.

ජෝන් ඩේවිගේ ග්‍රන්ථයේ viii පරිච්ඡේදය එකල ලංකාවේ පැවැති වෛද්‍ය කිරුම් මිණුම්, ගණක ශාස්ත්‍ර, වඩු කර්මාන්තය, යකඩ වැඩ හා කෘෂිකර්මය පිළිබඳව ශිල්ප ක්‍රම හා විද්‍යාඥානය පිළිබඳ විස්තරයක් කරයි. ජෝන් ඩේවි කියන පරිදි ලංකාවේ කෘෂිකර්මය ගොඩ සහ මඩ වශයෙන් කොටස් දෙකකි. ගොඩ ගොවිතැන කඳු බෑවුම්වල

(වාරි මාර්ගනොකළ හැකි) කෙරුන අතර මෙම ඉඩම් වල ගොඩ වී සහ ඉරිඟු වර්ග වැඩි වශයෙන් වගා කරන ලදී. දුප්පත් ගොවියන් මෙම හේන් ගොවිතැනෙහි යෙදුන බව ඩේවි පෙන්වා දෙයි. වාරි මාර්ග කළ හැකි නිම්න බෑවුම් වල වී ගොවිතැන් කරන ලදී. මොහු කියන පරිදි කුඹුරු ගොවි තැන ආරම්භ වනුයේ කුඹුරේ වනාත කෙටීම සහ වේලි සුද්ද කිරීම සමඟය. දෙවනුව ලියැදි වල වක්කඩ බැඳ ජලය රැස් කරයි. ටික දිනකින් ගවයන් බැඳි නඟුලෙන් සීසායි. සතියකට පසු දෙවන හීය හැම හෝ ගවයන්ගෙන් මඩ කිරීම ගොවියාගේ අභිමතය පරිදි කෙරේ. ලී නගුල ඉතා ශක්තිමත්ය. නගුලට සවිකරණ හීවැල කම්මල්වල සාදන ලද්දකි. පස කැඩී පෙරලීම මෙම හීවැල මගින් කෙරේ. ගවයන්ගේ ගෙලට අවහිර නොවන පරිදි වියගස සාද ගැනීමට පැරණි ගොවියා දන සිටියහ. ලීයෙන් සාද ගන්නා ගොවි උපකරණ ප්‍රධාන තැනක් ගත්තේය. ගොවිපල බලය සම්බන්ධව ගවයා [මී ගවයා සහ ගොනුන්] මෙන් මිනිස් ශ්‍රමයද එකසේ වැදගත් විය. අස්වැන්න වියලා ගැනීමට සූර්ය රශ්මිය භාවිතා කළ අතර අස්වැන්න පොලා ගැනීමට ස්වාභාවික සුළඟ යොද ගන්නා ලදී. මෙම ක්‍රම ලංකාවේ සුළු ගොවියන් වැඩි දෙනෙකු විසින් අදද භාවිතා කරන බව ප්‍රකාශ කළ යුතුව තිබේ. පැරණි ගොවියා විසින් භාවිතා කරන ලද ගොවි උපකරණ සම්පූර්ණයෙන්ම වාගේ ලියෙන් සහ යකඩ භාවිතා කිරීමෙන් දේශීය කම්මල්වල නිපදවා ගන්නා ලද ඒවාය. මේ අනුව කෘෂිකාර්මික කටයුතු කාර්මික සහ අනෙකුත් ශිල්පඥාන සමඟ සම්බන්ධවී තිබූ බව පෙනේ. ජෝන් ඩේවි කියන පරිදි කඳුකර ප්‍රදේශවල කඳු බෑවුම් දිගේ නිම්න තෙක් මලු ආකාර ලියැදි ගොඩ නගන ලද්දේ උදලු භාවිතයෙනි. මෙම උදලු දේශීය කම්මල් කරුවන් විසින් නිපදවන ලද ඒවාය. එක් කඳු ගැටයක සිට අනෙක් කඳු ගැටයේ මලු ආකාර ලියැදි පේළි තෙක් ජලය ගෙන යාම සඳහා (වාරිමාර්ග ක්‍රමයක්) ලී වලින් සාදන ලද පයිප්ප වර්ගයක් හෝ පීලි වර්ගයක් භාවිතා කළ ආකාරය තමා දුටු බව ජෝන් ඩේවි කියයි. මෙහිදී ගොවියාගේ දීර්ඝ කාලීන පළපුරුද්ද ස්වකීය දක්ෂතාවය සහ තීරණය බොහෝ සේ බල පැවැත්වූ බව ඔහුගේ අදහසය.

දුප්පත් ගොවියන් විසින් හේන් ගොවි තැනේදී භාවිතා කරන ලද උපකරණ පිළිබඳ විස්තරයක් ජෝන් ඩේවිගේ ග්‍රන්ථයේ එයි. කැලෑ කැපීමේදී වල්කැත්ත සහ පොරව මුල් තැනක් ගත්තේය. ගොඩ ගොවිතැනේදී නගුල භාවිතය අසීරුවූ විට උදැල්ල භාවිතා කරන ලද ආකාරය ඔහු දක ඇත. පාංශු බාදනය වැලැක්වීම පිණිස උදැල්ලෙන් වැටි ඉදිකොට වැල් බෝග වර්ග එම වැට දිගේ වගා කිරීම පැරණි ගොවියන්ගේ එක් ක්‍රම ශිල්පයකි. මෙම උපකරණ සියල්ලම වාගේ දේශීය අමුද්‍රව්‍යය යොදා නිෂ්පාදනය කර තිබීම විශේෂ සිද්ධියකි. අනෙක් අතට මෙම උපකරණ වලින් කොටසක් ගොවියාට තමා විසින්ම නිපදවා ගත හැකි ආකාරයේ ඒවාය. මෙතයින් විස්තර කරන ලද සම්ප්‍රදායික ගොවිපල තාක්ෂණය, ගොවියාට වඩා ලාභදායක වනවා සේම ඔහුට පාලනය කර ගත හැකි දේශීය වශයෙන් නිෂ්පාදනය කර ගත හැකි ආකාරයේ උපකරණ මුල්කොට පැවැතීම නිසා එහි ලාභ දයක මෙන්ම පහසු තාවය සහ අසංකීර්ණත්වය නිසා අතීතයට සේම වර්තමානයට සහ අනාගතයටද එකසේ වැදගත් බව නොකිව මනාය.


10


9

10. කුල්ල.

9. දෑකැත්ත.